# 9

# අර්ථාවබෝධය

මුල් ම පාඩමේ දී උගත් පරිදි සිංහල භාෂාවේ ව්‍යවහාර දෙකක් හෙවත් 'ද්වීරූපතාවක්' තිබෙන බව අපි දනිමු. ඒ කථන ව්‍යවහාරය හා ලිඛිත ව්‍යාවහාරය වශයෙනි. 'බස්පාපැදිය' නමැති රූපසටහන ඔස්සේ ද මේ පිළිබඳ ව සවිස්තර ව කතා කර ඇත. පහත නිදසුන නැවත සිහිපත් කර බලන්න.

'මං ඉස්කෝලේ යනවා.' - *කථන ව්‍යවහාරය*

'මම පාසල් යමි.' - *ලිඛිත ව්‍යවහාරය*

ඉහත කථන හා ලිඛිත ව්‍යවහාර දෙක පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීම මෙහි දී අර්ථාවබෝධය යන්නෙන් අදහස් කරයි. එනම් මේ ව්‍යවහාර දෙකේ දී ම භාවිත කරන වචන, යෙදුම්, වාක්‍ය ආදියෙහි අරුත්, අදහස්, තේරුම් මැනවින් වටහා ගැනීම යි. මෙහි දී ලිඛිත ව්‍යවහාරය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කෙරේ. එහි දී පහත දැක්වෙන පොදු උපදෙස් කිහිපය ඔබට යම් රුකුලක් සපයනු ඇති.

1 යම් වැකියක, පාඨයක වචන කෙරෙහි සැලකිලිමත් ව අවධානයෙන් යුතු ව කිහිප වරක් කියවීම.
2 එහි දී ඔබට ආගන්තුක අලුත් වචන හා අදහස පැහැදිලි නැති අරුත් මතක නැති වචන, යෙදුම් සටහන් කර ගැනීම.
3 ඒවා පිළිබඳ ව ගුරුවරයකුගෙන් අසා දැනගැනීම හෝ වෙනත් පොත්පත්, අන්තර්ජාල, පුවත්පත් ආදිය මගින් සොයා දැනගැනීම.
4 නිශ්චිත ව ම දැනගැනීම සඳහා ශබ්දකෝෂයක් (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය, ගුණසේන මහා සිංහල ශබ්දකෝෂය වැනි) පරිශීලනය කිරීම.
5 අදහස් සොයා ගැනීමෙන් පසු වැකිය හෝ පාඨය නැවතත් කියවා අර්ථය තහවුරු කර ගැනීම.
6 එවැනි වැකි, පාඨ, වචන යෙදුණු වෙනත් අවස්ථා කිහිපයක් හෝ විමසා බැලීම, සිහිපත් කර ගැනීම

පහත දැක්වෙන්නේ මහාචාර්ය තිස්ස කාරියවසම්, ප්‍රණීත් අභයසුන්දර යන විද්වතුන් විසින් සංස්කරණය කර ඇති 'මොහොට්ටිවත්තේ ශ්‍රී ගුණානන්ද සමරු කලාපයේ සඳහන් ලිපියකින් උපුටා ගත් ඡේදයකි.

. . .

*සමාජය ක්‍රමයෙන් විකාශනය විය යුතු අතර විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය හේතුවෙන් එය මුහුකුරා යන තත්ත්වයට පත් වේ. මේ සඳහා විවිධ පුද්ගලයෝ කරළියට පැමිණෙති. කලාව සම්බන්ධ ව, විද්‍යාවන් සම්බන්ධ ව, දේශපාලනය සම්බන්ධ ව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනෙන්නට හැකි ය. ඒ අතර ම කලාවන් සමගින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය තුළින් ඉතිහාසයේ ස්ථානයන් දිනා ඇති පුද්ගලයන් ද එමට ය. එවැනි අය වීරයන් ලෙස ද, හඳුන්වන්නට හැකි ය. ධර්මවීර, යුද්ධවීර, දානවීර ලෙසට වීරයෝ තෙවැදෑරුම් වෙති.*

. . .

අර්ථාවබෝධය සඳහා මුලින් දී ඇති උපදෙස් කෙරෙහි දැන් අවධානය යොමු කරන්න. ඒ අනුව ඉහත ඡේදය හොඳින් කියවන්න. එහි කෙනකුට තේරුම් ගැනීමට අපහසු යැයි සිතිය හැකි වචන තෝරන්න. පහත පරිදි සටහන් කර ගැනීම මුලින් ම කළ හැකි ය.

. . .

*සමාජය ක්‍රමයෙන් <u>විකාශනය</u> විය යුතු අතර විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය හේතුවෙන් එය <u>මුහුකුරා</u> යන තත්ත්වයට පත් වේ. මේ සඳහා විවිධ පුද්ගලයෝ <u>කරළියට</u> පැමිණෙති. කලාව සම්බන්ධ ව, විද්‍යාවන් සම්බන්ධ ව, දේශපාලනය සම්බන්ධ ව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනෙන්නට හැකි ය. ඒ අතර ම කලාවන් සමගින් ම ධර්මය <u>පෙරටු</u> කර ගෙන කළ දායකත්වය තුළින් ඉතිහාසයේ <u>ස්ථානයන්</u> දිනා ඇති පුද්ගලයන් ද <u>එමට</u> ය. එවැනි අය වීරයන් ලෙස ද, හඳුන්වන්නට හැකි ය. ධර්මවීර, යුද්ධවීර, දානවීර ලෙසට වීරයෝ <u>තෙවැදෑරුම්</u> වෙති.*

. . .

ඒ අනුව ගුණසේන මහා සිංහල ශබ්දකෝෂයේ එම වචන සඳහා දී ඇති තේරුම් අතරින් මේ වචන යෙදී ඇති පරිසරය අනුව අර්ථයෙන් වඩාත් ම ගැළපෙන වචනය තෝරා ගෙන ඇත.

| | | |
|---|---|---|
| විකාශනය | = | ඉදිරියට ගෙන ඒම |
| මුහුකුරා | = | මෝරා |
| කරළියට | = | වේදිකාව (මෙහි දී 'සමාජයේ ඉදිරියට ඒම' ලෙස අදහස ගත යුතු යි.) |
| පෙරටු | = | පළමු වැන්න |
| ස්ථානයක් | = | තැනක් |
| එමට | = | බහුල |
| තෙවැදෑරුම් | = | තුන් ආකාර |

මෙලෙස ඡේදයේ තේරුම් ගැනීමට අපහසු වචනවල අරුත් පැහැදිලි කර ගන්නා අතර ම වාක්‍යවල තේරුම ද මැනවින් වටහා ගත යුතු ය. පූර්ණ අර්ථාවබෝධයක් ලැබෙන්නේ එවිට ය. ඒ අනුව පහත ප්‍රශ්නවලට ඡේදය ආශ්‍රයෙන් පිළිතුරු සෙවීමෙන් ද අර්ථාවබෝධය ලබා ගැනීම පහසු වන අතර අර්ථාවබෝධය නිසි ලෙස සිදු වී ඇති දැයි දැනගැනීමටත් හැකියාව ලැබේ.

1. සමාජය මුහුකුරා යන තත්ත්වයට පත් වන්නේ කුමක් නිසා ද?
   විවිධ පුද්ගලයන්ගෙන් ලැබෙන පෝෂණය නිසා
2. මෙම ඡේදයට අනුව යම් කෙනකු විශේෂයෙන් කැපී පෙනිය හැකි විෂය ක්ෂේත්‍ර මොනවා ද?
   කලාව, විද්‍යාව සහ දේශපාලනය
3. යම් යම් පුද්ගලයන් ඉතිහාසයේ යම් ස්ථානයක් දිනා ඇත්තේ කුමන හේතුවක් නිසා ද?
   කලාවන් සමගින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය හේතුවෙන්.
4. වීරයන් ලෙස හඳුන්වන්නේ කවුරු ද?
   කලාවන් සමගින් ම ධර්මය පෙරටු කර ගෙන කළ දායකත්වය නිසා ඉතිහාසයේ යම් ස්ථානයක් දිනා ඇති පුද්ගලයන් වීරයන් ලෙසින් ද හැඳින්වේ.
5. තෙවැදෑරුම් වීරයෝ කවරහු ද?
   ධර්මවීර, යුද්ධවීර හා දානවීර නමින් හැඳින්වෙන වීරයන් තුන් පිරිස.

මේ අනුසාරයෙන් ගද්‍ය පමණක් නොව පද්‍ය ඛණ්ඩවල ද අර්ථාවබෝධය ලබා ගත හැකි ය. මෙම පෙළ පොතේ කුසලතා වර්ධනය සඳහා ලබා දී ඇති අභ්‍යාස බොහෝමයක් ම සකසා ඇත්තේ ඔබේ අර්ථාවබෝධ හැකියාව වර්ධනය වන පරිදි ය. මෙවැනි පාඩමක් විශේෂයෙන් ඇතුළත් කර ඇත්තේ මූලික කරුණු කිහිපයක් අවධාරණය කරනු පිණිස යි.



නොමිලේ බෙදාහැරීම පිණිස ය.

# කුසලතා වර්ධනයට:

1. පහත සඳහන් කවි පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## හෙළ රණ දෙරණ

හෙළ පුතේ මේ රට ඔබේ
ඔබට එය උරුම ව තිබේ
මෙවැනි පොළොවක් මුළු ලොවේ
නොමැත මෙහි හැම දේ වැවේ
ඔබේ රට ඔබ සරු කරන්නට
පුතේ අද සිට හිතට ගන්නට
ඔබෙන් විය යුතු යුතුකම එසේ
ඉටු කරනු කුසගිනි නැසේ
රටින් රට හිඟාමනේ යන්නට
නිගරුවකි එය සිංහලුන් හට
ඔබට රිසි දේ වගා කරමින්
එයින් කුසගිනි නිවා ගනිමින්
රටත් රැකගෙන හෙළ පුතේ
දැයත් රැකගෙන හෙළ පුතේ
විජිතපුර බලකොටු එදා
කඩා දැය කරගෙන මුදා
ඔබට නිදහස රැක දෙමින්
හෙළ විරුන් බල පෙන්වමින්
අපේ එඩිතර වීරයන්හට
පුතේ හොඳ නැහැ නිගා දෙන්නට
ඔබත් එම මග ගෙනැ පුතේ
සරු කරනු රට හෙළ පුතේ
රටේ ආලෝකය ඔබයි
ඔබේ ආලෝකය රටයි
හෙළ පොළොව ලොව සරු බිමයි
පුතේ ! ඔබ ඉපදුණ බිමයි

*- වස්කඩුවේ සීලදාස*

i (අ) මේ රට උරුම ව තිබෙන්නේ කාහට ද?
(ආ) සිංහලුන්හට නිගරුවක් වන්නේ කුමක් ද?
(ඇ) කුසගිනි නිවාගත යුත්තේ කුමක් කිරීමෙන් ද?
(ඈ) එදා දැය මුදා ගත්තේ කෙසේ ද?
(ඉ) නිගා දෙන්නට හොඳ නැත්තේ කාහට ද?
(ඊ) ලොව සරු බිම කුමක් ද?

ii (අ) මෙම ගීතයේ සඳහන් පහත යෙදුම් සඳහා සුදුසු සමාන පද ලියන්න.

- උරුම
- නිගරුව
- රිසි
- හිඟමනේ
- සරු
- ආලෝකය
- එඩිතර
- හෙළ
- දැය

2. පහත දැක්වෙන කවිය කියවන්න. එහි අදහස ලියන්න. කවිය කටපාඩම් කර ගන්න.

